# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2412/39 - 2024 නොවැම්බර් මස 30 වැනි සෙනසුරාදා - 2024.11.30**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/2023/119.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2024.05.28 දිනැති හා අංක 2386/03 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2024.05.16 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් උස්වැටකෙයියාව, ශාන්ත මරියා පාර, අංක 57/2 හි පදිංචි ඩී. සී. ජෝන් මහතා සහ කොළඹ 02, සර් ජේම්ස් පීරිස් මාවත, අංක 192 හි පිහිටි කෙන්ට් ට්‍රොෆීස් ඇන්ඩ් අවෝඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A/20/2024 හා 2024.10.24 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2014 නොවැම්බර් මස 20 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවේදී ය.**

ගොනු අංකය : IR/COM/03/2023/119

නඩු අංකය : A/20/2024

ඩී. සී. ජෝන් මහතා
අංක 57/2,
ශාන්ත මරියා පාර,
උස්වැටකෙයියාව.

*පළමු පාර්ශ්වය*

කෙන්ට් ට්‍රොෆීස් ඇන්ඩ් අවෝඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක 192,
සර් ජේම්ස් පීරිස් මාවත,
කොළඹ 02.

*දෙවන පාර්ශ්වය*

පළමු පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටීම.
නීතිඥ ගොඩ්වින් සිල්වා මහතා,
නිතිඥ එස්. ඩී. ජයසිංහ මිය,
දෙවන පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටීම
නීතිඥ කේ. බී. ජී. ප්‍රේමදාස මහතා
ගණකාධිකාරී ධම්මික අනෝපලාල් කුමාර මහතා

**ප්‍රදානය**

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් ගරු අමාත්‍යතුමා වෙත පැවරී ඇති බලතල අනුව 2024.05.16 වන දින හා අංක IR/COM/03/2023/119 ලිපියෙන් ඒ. බී. හේරත් වන මා බේරුම්කරු වශයෙන් පත්කොට මා වෙත යොමු කර ඇත.

**ආරාවුලට තුඩුදුන් කාරණය**

බේරුම්කරණය සඳහා මා වෙත යොමු කර ඇති උක්ත නියෝගය ප්‍රකාරව පහත සඳහන් දෙපාර්ශ්වය අතර, උද්ගතවී ඇති කාර්මික ආරාවුලයි.

මෙම ආරාවුලට හේතු වී ඇති කාරණය ලෙස කම්කරු කොමසාරිස් ජනරාල් එච්. කේ. කේ. ඒ. ජයසුන්දර මහතා විසින් නිකුත් කරන ලද ඔහුගේ අංක IR/COM/03/2023/119 හා 2024.04.29 දින ලිපිය අනුව " කෙන්ට් ට්‍රොෆීස් ඇන්ඩ් අවෝඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ සේවය කරන ඩී. සී. ජෝන් මහතා වෙත ලබාදුන් දීමනා අඩුකිරීම හා සහකාර කළමනාකරු (මානව සම්පත් සංවර්ධන හා පරිපාලන) ලෙස සේවය කළ ඔහුගේ තනතුර පරිපාලන නිලධාරී ලෙස පහත හෙළීම මගින් අසාධාරණයක් සිදුවී තිබේ ද යන්නත් එසේ අසාධාරණයක් සිදුවී තිබේ නම් හිමිවිය යුතු සහන කවරේද පිළිබඳ වේ".

පහත සඳහන් දිනයන් යටතේ නඩු අංක දින කාර්මික අධිකරණයට දෙපාර්ශ්වයම කැඳවා විභාග පවත්ව ඇත.

2024.06.13
2024.06.19
2024.06.25
2024.06.28
2024.07.02
2024.07.10
2024.07.30
2024.08.09
2024.08.13
2024.08.22
2024.08.30
2024.09.25

මෙම නඩුවේ ඉල්ලුම්කරු වන ඩී. සී. ජෝන් මහතා 2002.03.18 වන දින වග උත්තරකාර සමාගමේ පිරිස් හා පාලන නිලධාරී තනතුරට බඳවා ගෙන ඇත. 2005.04.25 පිරිස් හා පරිපාලන සහකාර කළමනාකරු ලෙස උසස් කර ඇත. නැවත 2021.01.15 දින සිට පාලන විධායක නිලධාරි තනතුරට පහත හෙළා ඇත. ඉන්පසු ඔහුගේ සේවය 2023.11.11 වන දින සිට අවසන් කර ඇති බව පෙනී යයි.

මෙම බේරුම්කරණය වෙත පවරා ඇත්තේ ඉල්ලුම්කරු වන ඩී. සී. ජෝන් මහතා වෙත ලබාදුන් දීමනා අඩුකිරීම හා සහකාර කළමනාකරු මානව සම්පත් සංවර්ධන හා පරිපාලන ලෙස සේවයට බඳවා ගත් ඔහුගේ එම තනතුර පරිපාලන නිලධාරි ලෙස පහත හෙළීම මගින් අසාධාරණයක් වී තිබේද එසේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේද යන්නත් වේ.

මොහු විසින් මෙම අධිකරණයේ ලකුණු කරන ලද A1 ලිපිය අනුව මූලික වැටුප රු. 10000/-ට අමතරව ප්‍රතිපූර්ණය කළ හැකි අක්මුදල් වශයෙන් රුපියල් 2000ක් ලබාදී ඇත. එමෙන්ම A3 ලිපියෙන් ප්‍රතිපූර්ණය කළ හැකි රු. 7600/-ක් හා ගමන් වියදම් හා වෙනත් වියදම් වශයෙන් රු.3500/-ක් ලබාදී ඇත. එසේ ලබාදුන් රු. 5000/- ප්‍රතිපූර්ණ දීමනාව සම්බන්ධව පහත කරුණු නිරීක්ෂණය වේ.

A5 ලිපිය අනුව 2009.07.15 දිනට අදාළව කළමණාකාර අධ්‍යක්ෂකවරයා නියෝග නොපිළිපැදීම නිසා එයට විරුද්ධව විනායානුකුල කටයුතු නොකිරීමට ඉල්ලුම්කරුගෙන් හේතු විමසා ඇත. A6 තම නිදහසට කරුණු ඉදිරිපත් කර ඇත. (පිටු අංක 17, 18)

A7 දරන 2009.08.10 දින දරන ලිපියෙන් ඉල්ලුම්කරු නිදහසට ඉදිරිපත් කළ කරුණු පිළිගත් නොහැකි බව දෙවන පාර්ශ්වය විසින් දැනුම් දෙමින් රු. 5000/-ක ප්‍රතිපූර්ණ දීමනාව අඩු කරන බව ඉල්ලුම්කරු වෙත ලිඛිතව දැනුම් දී ඇත. (පිටු අංක 151) (A7 ලිපිය)

මේ සම්බන්ධයෙන් ඉල්ලුම්කරු අධිකරණයේ සාක්ෂි ලබා දෙමින් කරන ප්‍රශ්න කිරීම් වලදී පහත සඳහන් පිළිතුරු සපයා ඇත. (පිටු අංක 151)

ප්‍ර ඒ ලිපියෙන් මොකද කියලා තියෙන්නේ?

පි ඒ ලිපියෙන් කියලා තියෙන්නේ මාගේ නිදහසට ඉදිරිපත් කළ කරුණු පිළිගත නොහැකි කියන එක

ප්‍ර එක පදනම් කරගෙන තමයි රු. 5000/- අඩු කළේ

පි ඔව් මට පනිෂමන්ට් එකක් හැටියට ඒක දිගටම අඩු කරගෙන ගියා

ප්‍ර ඒ කියන්නේ තමන්ගේ දීමනා වලින් අඩුකරගෙන ගියා

පි ඔව් සේවය අවසන් වන තුරුම ඒක ගෙව්වේ නෑ.

මෙම දීමනා අඩු කිරීමට අදාළ පහත කරුණු නිරීක්ෂණය වේ.

එනම්, පළමු පාර්ශ්වය සිය ලිඛිත දේශනය ඉදිරිපත් කරමින් මූලික වැටුප චෙක් පත් දෙකක් තුළින් ගෙවීම් තුළින් මූල්‍ය වංචාවක් සිදු කර ඇති බවත් ප්‍රතිපූර්ණය යනුවෙන් තවත් කොටසක් ගෙවීම තුළින් EPF/ETF අහිමි කිරීමක් සිදු කර ඇති බවට කරුණු ඉදිරිපත් කරන ලදී. (පිටු අංකය 332) (පැ 8 B)

එහෙත් මේ පිළිබඳ දෙවන පාර්ශ්වය කරුණු ඉදිරිපත් කරමින් සිය ලිඛිත දේශනයේ සඳහන් කර ඇත්තේ මෙම ඉල්ලුම්කරුට කළමනාකරණ අධ්‍යක්ෂවරයා පැවරූ කාර්යය ඉටු කිරීම පැහැර හැරීමට එරෙහිව එතෙක් ගෙවූ අමතර ගෙවීම් වන රු. 5000/- වන කපා හැරීමට තීරණය කර ඒ බව 2009.08.10 ලිපියෙන් ඉල්ලුම්කරුට දන්වන ලද බවයි. එම ලිපිය R3 වශයෙන් ලකුණු කර ඇත. (පිටු අංක 430)

එහෙත් ඉන් පසුව අඛණ්ඩව 2010, 2011, 2012, 2013, 2014, 2015, 2016 යන වර්ෂවල මූලික වැටුප හා අමතර දීමනා වැඩි කර ගෙවා ඇති බව දෙවන පාර්ශ්වය සිය ලිඛිත දේශනයේ සඳහන් කර ඇත. එය ඉල්ලුම්කරු වෙත ලිඛිත දැනුම් දී ඇති බව අංක 16, 17, 18, 19, 20, 21 හා 22 යන ලිඛිත දේශනයට අමුණා ඇති ඇමුණුම් වලින් තහවුරු කර ඇත.

එමෙන්ම කළමනාකරණ අධ්‍යක්ෂවරයා 2020.10.23 වන දින රාත්‍රියේ හෘදයාබාදයකට ලක්ව රියදුරු සම්බන්ධ කර දෙන ලෙසට ඉල්ලුම්කරු වෙත කරන ලද ඉල්ලීම හා ඊට ඉල්ලුම්කරු දැක්වූ ප්‍රතිචාරය හා ඊට අදාළව දෙවන පාර්ශ්වය විසින් 2020.11.09 දාතමින් ඉල්ලුම්කනරු වෙත අවවාදාත්මක ලිපියක් නිකුත් කරමින් කියා ඇත්තේ ඉල්ලුම්කරු දෙවන පාර්ශ්වය කෙරෙහි ඇති විශ්වාසය කඩ කර ඇති බවයි. (පිටු අංක 419, 420) (ඇමුණුම් 23)

එමෙන්ම 2020.12.02 දින ඉල්ලුම්කරු විසින් ඔහුගේ රාජකාරි මේසයේ ලාච්චු කළමනාකාරිත්වය විසින් විවෘත කර ඇති බවටත් එම මේස ලාච්චුවේ තිබූ රු. 35000/-ක මුදල නොමැති බවට බොරැල්ල පොලිස් ස්ථානය වෙත පැමිණිල්ලක් කර ඇති බවයි. මෙම පැමිණිල්ල අනුව බොරැල්ල පොලිසිය විසින් 2020.12.08 වන දින වගඋත්තරකාර සමාගමේ ඉහළ කළමනාකාරිත්වය පොලිස් ස්ථානය වෙත කැඳවා ප්‍රශ්න කර ඇත. මෙම පරීක්ෂණයේ දී දෙවන පාර්ශ්වය විසින් ඉල්ලුම්කරුට රාජකාරි කටයුතු සඳහා ලබාදුන් ලාච්චු කළමනාකාරිත්වය විසින් විවෘත කර ඇති  බවටත් එම මේස ලාච්චුවේ තිබූ රු 35000/-ක මුදල නොමැති බවට බොරැල්ල පොලිස් ස්ථානය වෙත පැමිණිල්ලක් කර ඇති බව පොලිසිය විසින් සඳහන් කර ඇත. මෙම පැමිණිල්ල අනුව බොරැල්ල පොලිසිය විසින් 2020.12.08 වන දින වගඋත්තරකාර සමාගමේ ඉහළ කළමනාකාරිත්වය පොලිස් ස්ථානය වෙත කැඳවා ප්‍රශ්න කර ඇත. මෙම පරීක්ෂණයේ දී දෙවන පාර්ශ්වය විසින් ඉල්ලුම්කරුට රාජකාරි කටයුතු සඳහා ලබාදුන් Pen Drive එක අස්ථානගත වී ඇති බවටත් තමාගේ පෞද්ගලික Pen Drive යොදා ගනිමින් ඉල්ලුම්කරු රාජකාරි කටයුතු කළ බව අනාවරණය වී ඇත. (පැ.6) (පිටු අංක 106, 107, 108)

තවද ආයතනයේ Pen Drive  එක අස්ථානගත වීමත් එය කළමනාකාරිත්වයට වසන් කිරීමත් එම Pen Drive එක යොදා ගනිමින් පරිබාහිරව මුදල් ඉපයීමේ කටයුතු වලට අවභාවිතා කල බවට චෝදනා කරමින් දෙවන පාර්ශ්වය විසින් ඉල්ලුම්කරු වෙත 2021.01.02 දින අංක 24 ලිපියෙන් දැනුම් දී ඇත. (පිටු අංකය 417, 418)

මේ අනුව ඉල්ලුම්කරු මෙම ආයතනයේ සේවයට බඳවා ගත් තනතුර දක්වා පහත හෙළා ඇති බව නිරීක්ෂණය වන අතර ඊට අදාළ රාජකාරි 2022.07.28 වන දින දෙවන පාර්ශ්වය විසින් ඉල්ලුම්කරු වෙත දන්වා ඇත. (පිටු අංක 400)

2020.11.09 වන දින ඉල්ලුම්කරු හා දෙවන පාර්ශ්වය අතර විශ්වාසය බිඳී යාමක් පිළිබඳව දෙවන පාර්ශ්වය විසින් ඉල්ලුම්කරුට දන්වා යැවීමෙන් පසු 2021.01.15 දින ලිපියෙහි (R4) ඉල්ලුම්කරුට විරුද්ධව චෝදනා නගමින් ඉල්ලුම්කරු කලින් දැරූ පරිපාලන විධායක තනතුරට පහත හෙළා ඇත.

එමෙන්ම ඉල්ලුම්කරුට පවරන ලද අමතර වගකීම් හා ආයතනයෙන් බැහැර ඉටුකර හැකි කාර්යයන් නතර කළ බවටත් ප්‍රධාන කාර්යාලයට සේවයට වාර්තා කිරීමටත් දන්වා ඇත. මේ අනුව ප්‍රතිපූර්ණයට යටත් වූ සියලු ගෙවීම් අත්හිටුවීමට දෙවන පාර්ශ්වය තීරණය කර 2021.02.29 ලිපියෙහි (R5) ඉල්ලුම්කරුට දැනුම් දී ඇත.

එමෙන්ම ඔහුට පවරා තිබූ අමතර රාජකාරි සියල්ල ඉවත් කර ඇත. ඔහුගේ සේවා ස්ථානය ලෙස කොළඹ 02 ජේම්ස් පීරිස් මාවතේ අංක 192 ස්ථානයේ පිහිටි ප්‍රධාන කාර්යාලයට සේවය වාර්තා කරන ලෙසට දන්වා ඇත.

ඉන්පසු ඉල්ලුම්කරු විසින් 2022.07.26 දින ලිපියෙන් තමා මේ පිළිබඳ සමාව ඉල්ලා සිටිනව බවට දෙවන පාර්ශ්වය වෙත ලිපියක් යවා ඇත. (R10 ලිපිය)

මෙ පිළිබඳව 2021.03.04 දාතමින් ඉල්ලුම්කරු විසින් කම්කරු දෙපාර්තමේන්තුවට පැමිණිලි කර ඇති අතර එහිදී මෙම කරුණ සමථයකට පත් නොවූ නිසා බේරුම්කරණයට යොමු කර ඇති බවට පෙනී යයි.

ඉල්ලුම්කරුගේ අමතර රාජකාරි ඉවත් කලත් ඔහුගේ තනතුර පරිපාලන විධායක නිලධාරි තනතුර දක්වා පහත හෙලුවත් ඔහු විසින් මේ දක්වා උපයා ගත් වැටුප දෙවන පාර්ශවය විසින් ගෙවා ඇති බව 2024.08.13 වන දින බේරුම්කරණ නඩු විභාගයේ දී අධිකරණයේ තහවුරු වී ඇත. (පිටු අංක 234)

එමෙන්ම 2024.08.13 බේරුම්කරණ විභාගයේ දී ඉල්ලුම්කරු සාක්ෂි දෙමින් (පිටු අංක 285)

ප්‍ර. තමන්ට දීලා තියෙන්නේ විධායක තනතුරක් නේද?

පි. ඔව්
එමෙන්ම 2024.08.22 බේරුම්කරණ විභාගයේ දී ඉල්ලුම්කරු සාක්ෂි දෙමින් (පිටු අංක 285)

ප්‍ර. තනතුර විධායක තනතුරක් නේද? දීලා තියෙන්නේ

පි. ඔව්

මේ අනුව ඉල්ලුම්කරු විධායක මට්ටමේ රැකියාව නිරත වූ බව ඔහු විසින් ම පිළිගෙන ඇත. එබැවින් ඔහුට අතිකාල දීමනා හිමි නොවේ. මෙම ආයතනයේ ඔහු සේවය කළ අවුරුදු 21ක කාල සීමාවට අදාළව අතිකාල දීමනා ලබාගෙන නොමැති බවද නිරීක්ෂණය විය.

මොහුගේ තනතුර පහත හෙළීමට පෙර අවස්ථාව කිහිපයකදීම ඉල්ලුම්කරුට අවවාද කර ලිපි නිකුත් කර ඇත.

2023.02.20 (අංක 04 ලිපිය)
2006.11.20 (අංක 10 ලිපිය)
2006.12.09 අභ්‍යන්තර අවවාද කිරීම් මැමෝ සටහන (අංක 11)
2009.07.21 නිදහසට කරුණු විමසීම (අංක 14 ලිපිය)
2018.11.27 ලිපිය අවසර නොගෙන විදේශගතවීමට අදාළව (අංක 22 ලිපිය)
2020.10.20 විශ්වාසය කඩ කළ බවට දැනුම් දීම (අංක 23 ලිපිය)
2021.01.15 තනතුර පහත හෙලීම, අමතර රාජකාරි හා ප්‍රතිපූර්ණ දීමනා ඉවත් කිරීම (අංක 25 ලිපිය)
2021.01.02 එක අවභාවිතා කළ බවට දැනුම් දීම (අංක 24 ලිපිය)
2021.02.13 කළමණාකරන විෂයට සුදුසු නොවන බවට තීරණය කිරීම.
2022.07.26 ඉල්ලුම්කරු තම වරදවල් පිළිබඳව සමාව ඉල්ලීම (R 10 ලිපිය)

මේ අනුව දෙවන පාර්ශ්වය විසින් සිය ලිඛිත දේශනයේ (පිටු අංක 11) එම තනතුර පහත දැමීමට අදාළව ඊට හේතු වශයෙන් දක්වා ඇත්තේ "අදාළ රාජකාරි ඉටු නොකිරීම, දිගින් දිගට බැහැර වීම, අදාළ කළමනාකාරිත්වයේ නියෝග පිළිනොගැනීම, තනතුරු අවභාවිතාය, තනතුරට නොගැලපෙන හැසිරීම, අවස්ථා කිහිපයකට අවවාද කිරීම යනාදී නිසා මෙම ආයතනයේ රැකියාව ආරම්භ කළ තනතුර දක්වා පහත හෙලන ලදී" යනුවෙනි.

**නිරීක්ෂණ හා නිගමනයන්**

දෙවන පාර්ශ්වය විසින් ඉල්ලුම්කරු කෙන්ට් ට්‍රොපිස් ඇන්ඩ් අවෝච්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයට ප්‍රථමයෙන් ම බඳවා ගෙන ඇත්තේ විධායක තනතුරක් සඳහාය. ඒ. අනුව විධායක නිලධාරීන්ට අතිකාල දීමනා හිමි නොවේ. ඒ අනුව ඔහුගේ ඉල්ලීමක් වන අතිකාල දීමනා ඉල්ලුම්කරුට හිමි නොවන බවට නිගමනය කරමි.

ඉල්ලුම්කරුට වැටුපට අමතරව ප්‍රතිපූර්ණ දීමනා වශයෙන් ලබාදුන් මුදල සේවක අර්ථසාධක අරමුදල් ගණනය කිරීම සඳහා ඉපයීමක් නොවන බවට නිගමනය කරමි. ඔහුගේ තනතුර පහත හෙලීමත් සමඟම දෙවන පාර්ශ්වය විසින් ඔහුට ලබාදුන් අමතර රාජකාරි සහ ප්‍රතිපූර්ණ මුදල සම්පූර්ණයෙන් ඉවත් කර ගත් බවට ඉල්ලුම්කරු ලිඛිතව දැනුවත් කර ඇත. මේ අනුව ප්‍රතිපූර්ණ දීමනා වශයෙන් ලබා දෙන මුදල්වලට අර්ථසාධක අරමුදල් ගණනය නොකරන බවට නිගමනය කරමි.

තනතුර පහත හෙළීමට අදාළව ඉල්ලුම්කරුට අවවාද කිරීම, ප්‍රතිපූර්ණ මුදල් ඉවත් කිරීම් වලට අදාළව දෙවන පාර්ශ්වය ඉල්ලුම්කරුට චෝදනා නගා ඇති අතර දැනුවත් කිරීම ද කර ඇත. අදාළ චෝදනා සම්බන්ධයෙන් ඉල්ලුම්කරු 2022.07.26 මුදල් අධ්‍යක්ෂක වෙත ලිපියක් යවමින් සමාව ඉල්ලා සිටිමෙන් ඉල්ලුම්කරු අදාළ වැරදි වලට සමාව ඉල්ලා ඇති බව නිගමනය වේ.

ඉල්ලුම්කරුට යවන ලද චෝදනා පත්‍රය (පැ.08 ලිපිය) අදාළ පරීක්ෂණයට රැකවරණ නිලධාරියෙකු නොමැති ව වුවද ඉල්ලුම්කරුට තමාගේ නිදහසට කරුණු ඉදිරිපත් කිරීමට ඉල්ලුම්කරුට තිබු ඉඩ ප්‍රස්ථාව ඉල්ලුම්කරු විසින්ම මඟ හැර සිටි බව නිරීක්ෂණය විය. මේ අනුව දෙවන පාර්ශ්වය විසින් ඒකපාර්ශික පරීක්ෂණයක් පවත්වා ඉල්ලුම්කරු සේවයෙන් නෙරපා ඇත.

එමෙන්ම ඉල්ලුම්කරු මෙම ආයතනයේ රියදුරුට විරුද්ධව දෙවන පාර්ශ්වයේ ඉල්ලීම මත සාක්ෂි නොදීම නිසා කළමනාකාර අධ්‍යක්ෂකවරයා තමාගෙන් පළිගත් බවට ඔහු ඉදිරිපත් කළ ලිපි ලේඛනවල සඳහන් කර ඇතත් සාක්ෂි වලදී සඳහන් කලත් එය තහවුරු කිරීමට ඔහු අපොහොසත් වූ බව නිගමනය කරමි.

ඉල්ලුම්කරු 2023.10.11 වන දින සිට සේවයෙන් නෙරපා ඇති බව බේරුම්කරණයේ දී කරුණු අනාවරණය විය. කෙසේ වෙතත් තනතුර පහත හෙළීමට අදාළව ඉදිරිපත් වූ සාක්ෂි හා ලේඛන අනුව දෙවන පාර්ශ්වය කටයුතු කළ අකාරය නිවැරදි බවට නිගමනය කරමි.

මේ අනුව අදාළ පරිපාලන විධායක තනතුරට පහත හෙළීමට අදාළව දෙවන පාර්ශ්වයෙන් ආසාධාරණයක් සිදු වී ඇති බවට තවදුරටත් කටයුතු කිරීම නිෂ්ඵල වී ඇත්තේ, මේ වන විටත් ඉල්ලුම්කරු දෙවන පාර්ශ්වය විසින් රැකියාවෙන් නෙරපා ඇති පසුබිමක බවද සඳහන් කරමි.

**ප්‍රදානය**

ඉහත කාරණා හේතුවෙන් කාර්මික නීතියේ ඉහළින්ම පිළිගැනෙන යුක්ති සහගත හා සාධාරණය නිගමනයන් වශයෙන් ඉල්ලුම්කරුට අසාධාරණයක් සිදු ඇති බවට නඟන චෝදනාව පදනම් විරහිත බැවින් ද කිසිදු ප්‍රදානයක් කිරීමට තරම් හේතු සාධක නොමැති බැවින් ද එවැනි නිගමනයන්ට නොඑළැඹෙමින් මෙම ඉල්ලීම ප්‍රතික්ෂේප කරමි.

**ඒ. බී. හේරත්**
බේරුම්කරු

2024 ඔක්තෝබර් මස 24 දින,
බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවේ දී ය.

EOG 11—0198

මගේ අංකය: IR/COM/01/2020/209.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2023.01.26 දිනැති හා අංක 2316/44 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2023.01.17 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන්, ගාල්ල, ඇත්තිලිගොඩ, සිරි සුභද්‍රාරාම පාර, අංක 223 හි පදිංචි තුදේශ් නිරන්තක මොහොට්ටි මයා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් ගාල්ල, පහළ ඩික්සන් පාර, අංක 19 හි පිහිටි දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A 19/2023 හා 2024.10.29 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 නොවැම්බර් මස 20 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවේ දී.**

IR/COM/01/2020/209
නඩු අංකය: A/19/2023

තුදේශ් නිරන්තක මොහොට්ටි මයා,
අංක 223,
සිරි සුභද්‍රාරාම පාර,
ඇත්තිලිගොඩ,
ගාල්ල.

*පළමු පාර්ශ්වය*

දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය
අංක 19,
පහළ ඩික්සන් පාර,
ගාල්ල.

*දෙවන පාර්ශ්වය*

කම්කරු හා විදේශීය රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දනර පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ ඔහුට පැවරී ඇති බලතල ප්‍රකාරව උක්ත ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා 2023 ජනවාරි මස 17 දිනැති නියෝගයෙන් බේරුම්කරුවෙකු වශයෙන් මා පත්කොට මා වෙත යොමු කර ඇත.

**ආරාවුලට හේතු වී ඇති කාරණය:**

බේරුම්කරණය සඳහා මා වෙත යොමු කර ඇති උක්ත නියෝගය ප්‍රකාරව ඉහත සඳහන් දෙපාර්ශ්වය අතර උද්ගත වී ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

“තුදේශ් නිරන්තක මොහොට්ටි මහතාට කළමණාකාර සහකාර (තාක්ෂණික නොවන) තනතුර සඳහා හිමිකමක් තිබේද හිමිකමක් තිබේ නම් සිදු වී ඇති අසාධාරණයන් සම්බන්ධයෙන් ලැබිය යුතු සහනයන් කවරේ ද යන්න පිළිබඳවයි.”

ඉහත සඳහන් ගාල්ල, ඇත්තිලිගොඩ, සිරි සුභද්‍රාරාම පාර, අංක 223 ස්ථානයේ පදිංචි තුදේශ් නිරන්තක මොහොට්ටි මහතා දකුණු පළාතේ පළාත් සභාවේ ව්‍යවස්ථාපිත ආයතනයක් වන දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ ගාල්ල දිස්ත්‍රික් ඉංජිනේරු කාර්යාලයේ වෙක්රෝල් පදනම මත අනියම් වැඩ පරිපාලක තනතුර සඳහා 2013.03.01 දින සිට පත්වීමක් ලබා එදින සිට සේවයට වාර්තා කර ඇත. ඉන් අනතුරුව ඔහුට 2014.10.24 වන දින සිට එම මාර්ග සංවර්ධන අධිකාරියේ ගාල්ල දිස්ත්‍රික් ඉංජිනේරු කාර්යාලයට ස්ථිර කම්කරු දෙක ශ්‍රේණියේ පත්වීමක් ලබාදී ඇත. ඒ අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014 චක්‍රලේඛනයට අනුව නොකඩවා දින 180ක් සම්පූර්ණ කළ සේවකයින් ස්ථිර කිරීමේ නියමය පරිදි 2014.10.24 වන දින සිට තුදේශ් නිරන්තක මහතා ඉහත කී කම්කරු තනතුරේ ස්ථිර කරනු ලැබ ඇත. ඒ අතර පැමිණිලිකරු තුදේශ් නිරන්තක මොහොට්ටි මහතා ඔහු 2014.10.24 වන දින ස්ථිර පත්වීම ලබාදුන්නායින් පසුව ස්ථිර පරිගණක නිලධාරිනියගේ රාජකාරි ඉටු කිරීමට පවරන ලද බව කියා සිටී.

ඉන් අනතුරුව 2015.01.26 වන දින ඔහුහට පළමු රාජකාරි පැවරීමේ ලිපිය බාරදුන් බවත් එදින දක්වා කලින් සඳහන් කළ පරිගණක නිලධාරිනියගේ රාජකාරි ඉටු කරනු ලද බව ප්‍රකාශ කරන ලදී. ඉන්පසුව ඔහු විසින් උසස්වීමක් ලබාගැනීම සම්බන්ධයෙන් 2016.08.31 වන දින ලිඛිතව ඉල්ලීමක් කරන ලද බවත් ඒ අනුව ඔහුට 2017.02.22 වන දින රාජකාරි පැවරුම් ලැයිස්තුවක් ලබාදුන් බවත් එම ලැයිස්තුවේ පැවරුම්වලට අනුව ඔහු විසින් පරිගණක රාජකාරි සහ ලිපිකරු රාජකාරි ඉටු කළ බවද ගාල්ල දිස්ත්‍රික් ඉංජිනේරු කාර්යාලයේ යතුරු ලේඛක වශයෙන් ලිපිකරුවන් දෙදෙනෙකුගේ ලිපිකරු රාජකාරි ඉටු කරන ලද නිලධාරියෙකු විශ්‍රාම යාම හේතුවෙන් (2016.11.17 දින) එම රාජකාරි ද ඔහු බාරයට පත්වී ඇති බව ප්‍රකාශ කරයි. ඒ අතර 2019 වර්ෂයේ දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ අභ්‍යන්තර උසස්වීම් ලබාදීමෙන් පසුව පුරප්පාඩු වුණ කළමණාකාර සහකාර (තාක්ෂණික නොවන) තනතුරේ පුරප්පාඩු 13 ක් සඳහා බාහිරින් බඳවාගැනීමට සිංහල හා ඉංග්‍රීසි භාෂාවලින් පුවත්පත් දෙකක දැන්වීම් පළ කර ඇති අතර එම පුවත්පත් දැන්වීම් අනුව මෙම අධිකාරියේ පැරණි අනියම් සේවකයින්ගේ සේවා කාලය 2003 බඳවාගැනීම් පටිපාටිය අනුව නම් අවුරුදු 4 ක් ද, 2013 බඳවාගැනීම් පටිපාටියට අනුව නම් අවුරුදු 5 ක් ද සම්පූර්ණ විය යුතු බවට සඳහන්ව තිබුණි.

ඒ අනුව ඒ වන විට ඔහුගේ සේවා කාලය 2003 බඳවාගැනීමේ පටිපාටිය අනුව වසර 4 ක් සම්පූර්ණ කර තිබූ බවත් 2013 බඳවාගැනීම් පටිපාටිය අනුව වසර 5 ක් සම්පූර්ණ විය යුතු වුවද ඒ සඳහා ඔහුහට මාසයකුත් දවස් කිහිපයක ඌනතාවයක් තිබූ බව ඔහු ප්‍රකාශ කර සිටී. මෙම පසුබිම මත 2019.09.02 වන දින සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට කෙටි කාලයක් තිබූ අවස්ථාවක ඔහු මාර්ග සංවර්ධන අධිකාරියේ පාලන අධිකාරිය වෙත වාචිකව ලිඛිතව කරුණු ඉදිරිපත් කරන ලද බවද සඳහන් කර සිටී. ඉන් අනතුරුව සම්මුඛ පරීක්ෂණයේ දී 2013 බඳවාගැනීම් පටිපාටිය අනුව ඔහුට වසර 5 ක සේවා කාලයක් සම්පූර්ණ නොවීම හේතුවෙන් බඳවාගැනීම් පටිපාටිය අනුව අවම සුදුසුකම වශයෙන් සඳහන් කර තිබූ ගණිතය විෂයට සම්මාන සාමාර්ථයක් නොමැති වීමත් ඔහුට ගණිතයට විෂය සාමාන්‍ය (S) සාමාර්ථයක් තිබීම හේතුවෙන් ඔහුට එම තනතුර ලබා නොදීමට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය තීරණය කර ඇත.

ඉහත කී පසුබිම මත තුදේශ් නිරන්තක මොහොට්ටි මහතා 2013.03.01 වැනි දින සිට 2013.05.17 දින දක්වා කම්කරුවෙකු ලෙස අනියුක්ත කරන ලද බව සඳහන් කළ ද ඔහු විසින් ඉටු කරනු ලැබුවේ එවකට ලිපිකාර සමාන්තර ශ්‍රේණියට රාජකාරි බව ද සැලකර

සිටී. එම පසුබිම මත ඔහු ලිපිකාර ශ්‍රේණියට අවශ්‍ය සුදුසුකමක් වන ලිපිකාර සමාන්තර ශ්‍රේණියට අයත් රාජකාරි ඉටු කිරීමට අවශ්‍ය වන හැකියාවන් වර්ධනය කර ගැනීමට බලාපොරොත්තුවෙන් එවකට ගාල්ල තාක්ෂණික විද්‍යාලයේ National Certificate And Communicator Technician (NVQ) සුදුසුකමට අදාළ පාඨමාලාව හැදෑරු බව ද මෙම තත්වය මත ස්ථිර තත්වයේ කළමනාකරණ සහකාර නිලධාරියෙකු විසින් ඉටු කළ යුතු රාජකාරි ඔහු විසින් ඉටු කරන ලද බව ද 2015.01.26 වැනි දින ලිපියේ A3(a) ලිපියේ අංක 1 සිට 8 දක්වා පවරා ඇති රාජකාරි කළමනාකරණ සහකාර ස්ථිර තත්වයේ නිලධාරීන් විසින් ඉටු කරනු ලබන රාජකාරි බව ද එයම 2017.03.29 වැනි දින දිස්ත්‍රික් ඉංජිනේරු ගාල්ල විසින් නිකුත් කරන ලද රාජකාරි පැවරීම් අනුව ද ප්‍රකාශ කර සිටී.

එබැවින් පැමිණිලිකාර පාර්ශ්වය වන තුදේශ් නිරන්තක මොහොට්ටි මහතා විසින් 2013 වර්ෂයේ සිටම මෙම පැමිණිල්ලේ වගඋත්තරකරු යටතේ කළමනාකරණ සහකාර ස්ථිර තනතුරකට අදාළ නිල රාජකාරි අනලස්ව ඉටු කළ ද ඔහු වෙත කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) තනතුර ලබා නොදීමෙන් ඔහුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කර ඇති බවට ද ඒ අනුව ඉහත කී තනතුරට හිමිවිය යුතු වැටුප් ලබානොදීමෙන් ද ආයතන ව්‍යුහය තුළ ඔහුට ලබාගැනීමට තිබූ උසස්වීම් අහිමි කිරීමෙන් ද සමාජය ඉදිරියේ ඔහුගේ තනතුරේ අභිමානය අහිමි කිරීමෙන් ද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛන උපදෙස්වලට පටහැනිව කටයුතු කිරීමෙන් ද රටේ පවතින පොදු කම්කරු නීති හා අණපනත්වලට පටහැනිව කටයුතු කර ඇති බව ප්‍රකාශ කර සිටී. ඒ අතර දකුණු පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් තුදේශ් නිරන්තක මොහොට්ටි මහතාට කළමනාකාර සහකාර තනතුරේ පිහිටුවන ලෙස නිර්දේශයක් කර ඇති බව ද ප්‍රකාශ කරන අතර ඔහුට කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) තනතුරකට පත්කරන ලෙස ද බේරුම්කරණයෙන් ඉල්ලා සිටී.

**බේරුම්කරණ විභාග පටිපාටිය :**

මේ සඳහා පැමිණිලිකාර පාර්ශ්වයත් දෙවන පාර්ශ්වය වන දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ කළමනාකාරීත්වයත් පහත සඳහන් දිනයන්වලදී බේරුම්කරණ විභාගය සඳහා කැඳවන ලදී. 2023.03.08, 2023.03.30, 2023.05.04, 2023.07.11, 2023.08.15, 2023.09.05, 2023.09.19, 2023.10.04, 2023.10.18, 2023.11.08, 2023.12.06, 2024.01.10 ඉහත කී දිනයන්හිදී මා විසින් බේරුම්කරණය විභාගය පවත්වා අවසන් කරන ලද අතර පරීක්ෂණය සඳහා වෙන් කරනු ලැබූ දිනයන් කිහිපයක් නොවැලැක්විය හැකි හේතූන් මත සංශෝධනය කිරීමට සිදුවූ බව සඳහන් කරමි.

**කරුණු විශ්ලේෂණය කිරීම :**

බේරුම්කරණය වෙත ඉදිරිපත් වූ කරුණු අනුව පහත සඳහන් සිද්ධි නිරීක්ෂණය කරමි.

**පැමිණිලිකාර පාර්ශ්වය -**

1. පැමිණිලිකාර පාර්ශ්වය සඳහන් කරන අන්දමට දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ බඳවාගැනීම් හා අභ්‍යන්තර උසස්වීම් පටිපාටියේ 2003 වර්ෂයට අදාළ හා 2013 වර්ෂයට අදාළ පටිපාටි 2 යටතේම අභ්‍යන්තර වශයෙන් කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) තනතුරුවලට බඳවාගැනීමේ අවස්ථාවන් සඳහා අයදුම්පත් කැඳවා ඇති අතර එයින් 2003 බඳවාගැනීමේ පටිපාටියට සේවා කාලයේ ඌනතාවයක් මත ද, 2013 බඳවාගැනීමේ පටිපාටිය සඳහා ගණිතය විෂයට සම්මාන සාමාර්ථයක් නොමැතිවීම මත ද මොහොට්ටි මහතා සුදුසුකම් ලබා නොමැති බව නිරීක්ෂණය වේ.

2. දකුණු පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් මොහොට්ටි මහතා වෙත කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) තනතුරකට පත්කිරීමට කර ඇති නිර්දේශය ක්‍රියාත්මක කිරීමට, බඳවාගැනීමේ පටිපාටිය යටතේ සපුරාලිය යුතු සුදුසුකම් සම්පූර්ණ නොකිරීම හේතු වන්නට ඇති බව ද නිරීක්ෂණය කරමි.

3. තව ද අනියම් කම්කරු තනතුරකට වෙක්රෝල් පදනම මත පත්වීමක් ලැබූ ඉල්ලුම්කරු, ඔහු වෙත පරිගණක රාජකාරි සහ ලිපිකාර රාජකාරි පැවරූ අවස්ථාවේ දී, ඔහු ඒ සම්බන්ධයෙන් විරුද්ධත්වයක් ප්‍රකාශ කිරීමක් හෝ කළමනාකාර සහකාර තනතුරකට අදාළ රාජකාරි ඉටු කිරීමට ඔහුගේ ඇති අකමැත්තක් හෝ ප්‍රකාශ කර නොමැති බව ද නිරීක්ෂණය වේ.

4. ලිපිකාර තනතුරකට අවශ්‍ය පරිගණක සාක්ෂරතාව ලබාගැනීම ද මොහොට්ටි මහතා වැඩිමනත් පරිගණක කටයුතු පිළිබඳව වැඩිදුර අධ්‍යනය කිරීමට යොමු වී ඇත්තේ ඔහු තුළ ලිපිකාර ශ්‍රේණියේ තනතුරකට පත්වීමට තිබූ බලාපොරොත්තු සහගත බව නිසා බව ද පෙනී යයි.

5. එහෙත් බඳවාගැනීමේ පටිපාටියෙහි සඳහන්වන අවම අධ්‍යාපන සුදුසුකම් වන ගණිත විෂයට සම්මාන සාමාර්ථයක් ලබාගැනීමට සාමාන්‍ය පෙළ විභාගයේ ගණිත විෂයට පෙනී සිට සම්මාන සාමාර්ථයක් ලබාගැනීමට ඔහුට හැකියාවක් නොමැති බවක් නිරීක්ෂණය නොවන අතර ඔහු එම අවම සුදුසුකම සම්පූර්ණ කර ගැනීමට කිසිදු අවංක උත්සාහයක් ගෙන තිබූ බවක් ද නිරීක්ෂණය නොවේ.

**වගඋත්තරකාර ආයතනය -**

1. දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) (MA 1-2) අභ්‍යන්තර බඳවාගැනීම් සහ උසස්වීම් 2019 සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සටහන් නිරීක්ෂණය කිරීමේ දී තුදේශ් නිරන්තක මොහොට්ටි මහතාට ගණිතය විෂයට සම්මාන සාමාර්ථයක් නොමැති බවත් මුල් පත්වීම් දිනය 2014.10.24 දිනය වන බවත් අවම වශයෙන් අවුරුදු 5ක ස්ථිර සේවා කාලයක් නොමැති බවත් නිරීක්ෂණය කරමි.

2. තව ද වගඋත්තරකාර ආයතනය විසින් ඉහත අංක 1න් කී තනතුරට බඳවාගැනීම සම්බන්ධයෙන් පැවති අභියාචනා පිළිබඳව පරීක්ෂණයේ දී ඉහත කී සුදුසුකම්වල ඌණතාවයන් හේතුවෙන් තුදේශ් නිරන්තක මොහොට්ටි මහතාට ඉහත කී කළමනාකාර (තාක්ෂණික නොවන) තනතුර ලබාදීම අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත නොකළ බව ද නිරීක්ෂණය කරමි.

**ප්‍රදානය**

බේරුම්කරණ විභාග අවස්ථාවලදී ඉදිරිපත් වූ කරුණු අනුව 2003 වර්ෂයේ දී කළමනාකාර සහකාර (තාක්ෂණික නොවන) තනතුර අභ්‍යන්තර වශයෙන් බඳවාගැනීම් / උසස් කිරීමේ පටිපාටිය අනුව "ගණිතය විෂයට සම්මාන සාමාර්ථයක්" අවශ්‍ය නොවූව ද, එම උසස්වීම් පටිපාටිය තුදේශ් නිරන්තක මොහොට්ටි මහතාගේ උසස්වීමට අදාළ කර ගැනීමට බාධාවක් ලෙස බලපාන ලද සාධක අතර ප්‍රධාන වශයෙන්ම හේතුවී ඇත්තේ ඊට අදාළ සේවා කාලය ඔහු සම්පූර්ණ කර නොමැතිවීම බව නිරීක්ෂණය වන අතර ආයතනයේ ඉතිහාසය දෙස බලනවිට ගණිතයට සාමාන්‍ය සාමාර්ථ ලබා තිබූ සේවකයන් කිහිපදෙනෙකුට කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන තනතුරට අභ්‍යන්තර වශයෙන් පත්වීම් ලැබී ඇති බවට නිරීක්ණණය වේ.

එහෙත් තුදේශ් නිරන්තක මොහොට්ටි මහතා අභ්‍යන්තර කළමනාකාර සහකාර (තාක්ෂණික නොවන) තනතුරට ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබන විට ක්‍රියාත්මක වූ 2013 වර්ෂයේ සංශෝධනය කරන ලද අභ්‍යන්තර බඳවාගැනීම් පටිපාටිය අනුව ඔහු නියමිත දිනට පූර්වාසන්න ස්ථිර පත්වීමට අවශ්‍ය අවුරුදු 5ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර නොතිබීමත්, ඔහු අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී ගණිතය විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව සමත්ව නොතිබීමත් බලපා ඇති බැවින් ඔහුට ඔහු ඉල්ලුම් කරන ලද කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) තනතුරට පත්වීමක් දීමට ආයතනයට කටයුතු කිරීමට

නොහැකි වී ඇති බැවින් ඔහුට එම තනතුර අහිමි වී ඇති බවත්, එහෙත් ආයතනයේ කළමනාකාරීත්වය විසින් ඔහු කම්කරු තනතුරක කටයුතු කරමින් සිටිය දී කළමනාකරණ සහකාර තනතුරකට අදාළ රාජකාරි ඉටු කර ගැනීමත් අතර ගැටළු සහගත සිද්ධියක් උද්ගත වී ඇත. මෙම පසුබිම මත ලිපිකාර ශ්‍රේණියකට අදාළ රාජකාරි ඉටු කිරීමට අවශ්‍ය පරිගණක සාක්ෂරතාව ලබාගැනීම වැනි අතිරේක සුදුසුකම් ලබාගැනීමට ඉල්ලුම්කරු අවංකව කටයුතු කර ඇති බවත් ඔහු විසින් ලිපිකාර ශ්‍රේණියට අදාළව ඉටු කරන ලද රාජකාරි අනලස්ව හා නිවැරදිව ඉටු කර ඇති බව ද නිරීක්ෂණය කරමි.

මෙම ගැටලුව සම්බන්ධයෙන් දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ පාලන අධිකාරිය මෙන්ම පැමිණිලිකාර පාර්ශ්වයෙන් ද ප්‍රබල අතපසු වීම් සිදු වී ඇති බව නිගමනය කරමි. තව ද දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ කළමනාකාරීත්වය 2013 වර්ෂයේ සිට අවුරුදු 11කට අධික කාලයක් තමා කම්කරු තනතුරක් දරන්නෙකු බව කම්කරු තනතුරක් දරනු ලබන පැමිණිලිකරුගෙන් කළමනාකරණ සහකාර තනතුරකට අදාළ කාර්යභාරය ඉටු කරවා ගෙන ඇත. පැමිණිලිකරු ද දැන දැනම ඉහළ තනතුරකට අදාළව රාජකාරි ඉටු කර ඇති බව ද නිරීක්ෂණය කරමි.

මෙහිදී මෙම සාවද්‍යතාවය නිවැරදි කිරීමට ආයතනයට ප්‍රමාණවත් කාලයක් තිබුණ ද එය නිවැරදි කිරීමට හෝ නිසි පියවරක් අනුගමනය කර නොමැත. එමෙන්ම පැමිණිලිකරු ද තමන්ට අදාළ සුදුසුකම් සම්පූර්ණ කර ගැනීමකින් තොරව කළමනාකරණ සහකාර තනතුරකට අදාළ රාජකාරි විරෝධතාවයකින් තොරව ඉටු කර ඇත. මෙහිදී ඔහු තනි පුද්ගලයකු බැවින් තම ස්වකීය අනාගත බලාපොරොත්තු සහිතව එසේ සිදුවන්නට අවකාශ තිබුණ ද, රාජ්‍ය ආයතනයක පරිපාලනයට සම්බන්ධ ආයතනයක කළමනාකාරිත්වය මීට වඩා වැඩි වගකීම් සහිතව කටයුතු කළ යුතුව තිබුණි.

එබැවින් එම දෝෂ ප්‍රමාණාත්මකව පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ කළමනාකාරිත්වයට 50%කට වඩා බර තැබීමක් තැබිය යුතු බවත් පැමිණිලිකරුට 50% වඩා අඩු බර තැබීමක් තිබිය යුතු බවට නිගමනය කරමි.

තව ද මෙම පසුබිම තුළ පැමිණිලිකරුට අයුතු මූල්‍ය වාසියක් ලැබී නැති බව ද තීරණය කරමි. මෙහි දී ඉල්ලුම්කරු විසින් එවකට දකුණු පළාතේ ගරු ආණ්ඩුකාරතුමා වෙත ඔහුට සිදු වී ඇති අසාධාරණය සම්බන්ධයෙන් අභියාචනයක් ඉදිරිපත් කරනු ලදුව එකී අභියාචනයේ කරුණු සලකා බලා එතුමා විසින් පැමිණිලිකරු වෙත කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන තනතුරක් ලබා දීමට සුදුසු බවට ද නිර්දේශයක් පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපතිතුමාට ද ලිපියක් යොමු කර ඇත.

තවද පැරණි බඳවා ගැනීමේ පටිපාටිය ක්‍රියාත්මක කළ කාලසීමාව තුළට අදාළව පැමිණිලිකාර පාර්ශ්වය වන තුදේශ් මෝහොට්ටි මහතා සුදුසුකම් ලබා නොතිබුන අතර, නව අභ්‍යන්තර බඳවා ගැනීම්/ උසස් කිරීමේ පටිපාටියේ බල පැවැත්වෙන 2016.04.19 දින සිට ක්‍රියාත්මක වන ඔහුට අවුරුදු 5 ට ආසන්න වශයෙන් දින 32 ක (සාමාන්‍ය ව්‍යවහාරයට අනුව ගණනය කළ විට) ඌණතාවයක් සහ අංපො.ස සාමාන්‍ය පෙළ ගණිතය විෂයට සාමාන්‍ය සාමාර්ථයක් (සම්මාන සාමාර්ථයක් නොතිබීම) මත ඔහු එම තනතුරට සුදුසුකම් නොලැබූ බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණයක් ගෙන ඇති බවද නිරීක්ෂණය විය.

එබැවින් තුදේශ් මහතාගේ පැමිණිල්ලට අදාළ ඉල්ලීම වන කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) තනතුරට පත්වීම ලැබීමට ඔහුගේ සේවා කාලය පිළිබඳ මේ වන විට ගැටලුව විසඳී ඇති අතර, ඔහු තවදුරටත් ඇ.පො.ස සාමාන්‍ය පෙළ ගණිතය විෂයට සම්මාන සාමාර්ථයක් ලබා නොතිබීම මත ඔහු ඉල්ලුම් කරනු ලබන තනතුර ලබා ගැනීමට ප්‍රායෝගිකව බාධාවක් ඇත.

එබැවින් දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය පැමිණිලිකරුගෙන් කළමනාකරණ සහකාර තනතුරකට අදාළ රාජකාරි ඉටු කරවා ගැනීම සඳහා පැමිණිලිකරු විසින් එකී තනතුරට අදාළ රාජකාරි ප්‍රතික්ෂේප කිරීමකින් තොරව ඉටු කිරීම යන ද්වන්දනාත්මක ක්‍රියාවලිය නිවැරදි කිරීම සඳහා දෙපාර්ශ්වයටම සාධාරණ සහ යුක්ති සහගත වන ලෙස පහත සඳහන් ප්‍රදානය තීරණය කරමි.

1. පැමිණිලිකරු වන තුදේශ් නිරන්තක මොහොට්ටි මහතාට 2024.12.01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) තනතුර සඳහා පහත සඳහන් කොන්දේසි වලට යටත්ව, එක් අවුරුදු පරිවාස කාලසීමාවක් සඳහා පත්වීම ප්‍රදානය කරමි.

**එහි සේවා කෝන්දේසි ලෙස**

2. මෙම එක් අවුරුදු පරිවාස කාල සීමාව තුළ තුදේශ් නිරන්තක මොහොට්ටි මහතා එම කාලසීමාව තුළ පැවැත්වෙන රජයේ විභාග දෙපාර්තමේන්තුවේ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ ගණිතය පිළිබඳ විෂයට අයදුම්පත්‍ර ඉදිරිපත් කොට, විභාගයට සාර්ථකව පෙනී සිට එම විෂය සඳහා "සම්මාන සාමාර්ථයක්" ලබාගත යුතුය.

3. මෙම පරිවාස කාල සීමාව තුළ තුදේශ් නිරන්තක මොහොට්ටි මහතා මීළඟට එළඹෙන අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයට අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීමට සහ විභාගයට පෙනී සිටීමට සහ එහි ප්‍රතිඵල විභාග දෙපාර්තමේතුව විසින් ප්‍රකාශයට පත් කිරීමට ප්‍රමණවත් වන කාල සීමාවක් බවට ද නිගමනය කරමි.

4. එම කාල සීමාව තුළ ඔහු අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයෙන් "ගණිතය විෂයට" සම්මාන සාමාර්ථයක් ලබා ගැනීමට අපොහොසත් වුවහොත් එකී එක් අවුරුදු පරිවාස කාලසීමාව අවසානයේ ඔහු දැනට දරන කම්කරු ශ්‍රේණියේ තනතුරට ආපසු යැවිය යුතුය.

5. තවද, පැමිණිලිකරු මෙම බේරුම්කරණ විභාගය අවසානයේ මුල්‍යමය සහනයක් අපේක්ෂා කර නොමැති හෙයින් පැමිණිලිකරුට මුල්‍යමය සහනයක් නොමැති බවට ද තීරණය කරමි.

තවද මෙම තනතුර සහ මෙම කොන්දේසීන් මෙම බේරුම්කරණයේ පැමිණිලිකරු වන තුදේශ් නිරන්තක මොහොට්ටි මහතාට පමණක් පෞද්ගලික වන සේ ලබාදිය යුතු බවට ද තීරණය කරමි.

තවද මෙම තීන්දුව *ගැසට්* ගත කිරීමෙන් ලිත්මසක් ඇතුළත ක්‍රියාත්මක කර අදාළ ගාල්ල දිස්ත්‍රික් කම්කරු කාර්යාලයට ලිඛිතව දැනුම් දිය යුතු අතර තුදේශ් නිරන්තක මොහොට්ටි මහතාට මෙම පත්වීම් ලිපිය හා කොන්දේසි ලිඛිතව දැනුම්දීම කළ යුතුය. ඊට අමතරව දකුණු පළාත් සභාවේ පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ පාලන අධිකාරිය විසින් තුදේශ් නිරන්තත මොහොට්ටි මහතා මීලඟට පැවැත්වෙන අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ ගණිතය විෂයට ඉල්ලුම් කිරීම, පෙනී සිටීම හා ප්‍රතිඵල සනාථ කිරීම යන පියවරයන් පිළිබඳව සමීප අධීක්ෂණයක් පවත්වාගත යුතුය.

තවද මේ පිළිබඳ දකුණු පළාතේ, පළාත් සභාවේ ප්‍රධාන ලේකම් හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ( පිරිස් පාලන) යන තනතුරු දරන නිලධාරීන්ට ලිඛිතව දැනුවත් කළ යුතු බව ද, එම ක්‍රියාවලිය පිළිබඳව පළාත් සභාවේ හා දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ ඉහළ කළමණාකාරීත්වයේ අධීක්ෂණය ද සිදුවිය යුතු බවටද නියම කරමි.

තවද මෙම තීරණය යුක්ති සහගත හා සාධාරණ තීරණයක් බවටද තීරණය කරමි.

**කේ. ඒ. එස්. කීරගල,**
බේරුම්කරු.

2024 ඔක්තෝබර් මස 29 වැනි දින.

EOG 11 - 0199

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.